පුද්ගලයින්ව නමින් හැඳින්වීමේදී තවමත් සම්මතයක් ලෙසින් "මහත්මයා (Mr.)", "මහත්මිය/මිය (Mrs.)" හෝ "මෙනෙවිය (Miss.)" යන හැඳින්වීම් ලෝකයේ භාවිතා වේ. එම හැඳින්වීම් වලදී විවාහක කාන්තාවක් නම් "මහත්මිය/මිය (Mrs.)" ලෙසින් යෙදීමත්, අවිවාහක කාන්තාවක් නම් "මෙනෙවිය (Miss.)" ලෙසින් යෙදීමත්, පුරුෂ පාර්ශවය සම්බන්ධයෙන් විවාහක අවිවාහක බව අදාළ කර නොගනිමින් පොදුවේ "මහත්මයා (Mr.)" ලෙසින් යෙදීමත් දැකිය හැක. ඊට උදාහරණයක් ලෙසින්, ලංකාදීප පුවත්පතේ (ජනවාරි 21, 2022) 'පාර්ලිමේන්තුව' ලිපිය තුළ සහ අරුණ පුවත්පතේ (ජනවාරි 21, 2022) 'පාර්ලිමේන්තුව' ලිපිය තුළ විවිධ පුද්ගලයින්ව හැඳින්වී ඇති ආකාරය ගත හැක.

කෙසේ වෙතත්, කාන්තාවකගේ විවාහක අවිවාහක බව නොදන්නේ නම් හෝ විවාහක අවිවාහක බව පදනම් කර නොගන්නා හැඳින්වීමක් අවශ්‍ය නම්, "Ms." යනුවෙන් වන හැඳින්වීමක් ද ඉංග්‍රීසි භාෂාවේ තිබේ. එපමණක් නොව, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය අදාළ කර නොගනිමින් පොදුවේ පුද්ගලයෙකු හැඳින්වීම සඳහා වන "Mx." යන යෙදුමක් ද ඉංග්‍රීසි භාෂාවට එක්වී තිබේ.

1) ඔබ සිතන ලෙසට, කිසිවෙකුගේ විවාහක අවිවාහක බව අදාළ වන හැඳින්වීම් ක්‍රමයක් අපට අවශ්‍ය වන්නේ ද? එහිදී විශේෂයෙන්ම පුරුෂයෙකු හැඳින්වීමේදී විවාහක අවිවාහක බව අදාළ නොවන හැඳින්වීම් ක්‍රමයක් තිබෙන්නේ නම්, කාන්තාවන් සම්බන්ධයෙන් ද එවැනි විවාහක අවිවාහක බව අදාළ නොවන හැඳින්වීම් ක්‍රමයක් අවශ්‍ය නොවන්නේ ද?

2) මහජන නියෝජිතයින් සම්බන්ධයෙන් දැක්වෙන මෙම ලිපි දෙක සලකා බලන විට, අරුණ ලිපිය තුළ ඔවුන්ව තනතුරු නාමයන් ඔස්සේ පමණක් හඳුන්වා තිබෙන ආකාරයට, ලංකාදීප ලිපිය තුළද අදාළ පුද්ගලයින්ගේ තනතුරු නාමයෙන් පමණක් ඔවුන්ව හැඳින්වීම ප්‍රමාණවත් නොවන්නේ ද?

මෙම සමස්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.theguardian.com/.../neither-mr-mrs-or-ms-but-mx
https://www.thetimes.co.uk/.../now-pick-mr-mrs-miss-ms-or...
https://daily.jstor.org/from-the-mixed-up-history-of-mrs.../